**ජාතික අධ්‍යාපන ආයතනය - 2022**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කල මතය

ජාතික අධ්‍යාපන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි ඡේද 09 අනුව මාස තුනකට අඩු කාලයකදී කල්පිරීමට නියමිත තැන්පතු මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්විය යුතු වුවද කෙටිකාලීන ආයෝජන රු.141,229,813 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය වර්ෂය තුල සත්‍ය මුදල් ගලාඒම් හා ගලායාම් මත පදනම්ව පිළියෙල කළ යුතු වුවත් එපරිදි පිළියෙල කර නොතිබුණි. | මාස 03 ට අඩු කාලයක දී කල් පිරීමට නියමිත රු.141,229,813/- ක් වටිනා ස්ථාවර තැන්පතු ජංගම වත්කම් යටතේ කෙටිකාලීන ආයෝජන ලෙස දක්වා ඇත. එය ඉදිරි ගිණුම් වර්ෂයේ දී ප්‍රමිත අංක 02 අනුව මුදල් හා මුදල් සමාන දෑ වල පෙන්වීමට කටයුතු කරනු ලබන බව.<br><br>එය වෙන වෙනම ප්‍රමිත අංක 02 අනුව 2023 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ලද රු.50,000,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් සිදුකර නොතිබුණි. | වාර්ෂික ගිණුම්වල ඇති ප්‍රාග්ධන ප්‍රදාන රු.මි. 50 ක මුදල ලැබී ඇත්තේ ප්‍රාග්ධන වියදම් සඳහාය. එබැවින් ප්‍රාග්ධන අරමුදල් සඳහා ලැබීම් ඇතුළත් කරනු ලබන්නේ මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනයේය. එබැවින් එය නිවැරදි ලෙස 2022 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් කර ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 කෙරෙහි අවධානය යොමු කරන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව සේවක පාරිතෝෂික ප්‍රතිලාභ ගණනයේදී ආයු ගණක ප්‍රතිලාභ ක්‍රමය (Actuarial Valuation Method) භාවිතා කළ යුතු වුවද, ආයතනය විසින් ප්‍රමිතයෙහි අවශ්‍යතාව අනුව කටයුතු කර නොතිබුණි. | 1983 අංක 12 දරන පාරිතෝෂික පනත අනුව ආරම්භයේ සිටම පාරිතෝෂික ගණනය කිරීම සිදු කර ඇත්තේ එම පනතේ විධි විධානයන්ට අනුවය. පාරිතෝෂික පනත ප්‍රකාරව ගෙවීම් කළ යුතුව ඇති බැවින් පාරිතෝෂික පනත අනුව පාරිතෝෂික ගණනය කිරීම සිදු කර ඇත. එබැවින් එහි කිසිදු දෝෂයක් නොමැති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 අනුව අස්පෘශ්‍ය වත්කම් සහ දේපළ, පිරියත හා උපකරණ වෙන්ව හඳුනා ගත යුතු බව පෙර වර්ෂයේ විගණන වාර්තා වලින් පෙන්වා දුන් නමුත් රු.3,027,020 ක් වටිනා පරිගණක මෘදුකාංග සමාලෝචිත වර්ෂය තුළදී ද දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව අස්පෘශ්‍ය වත්කම් වන පරිගණක මෘදුකාංග වටිනාකම වන රු.3,027,020/- මුදල 2023 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කර ඉදිරිපත් කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව පාඨමාලා ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරන බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයට අදාළ පාඨමාලා ගාස්තුව නිවැරදිව හඳුනාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ලද රු.924,488,875 ක මුදල පාඨමාලා ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පාඨමාලා ආදායම වශයෙන් ගිණුම් ගත කර ඇත්තේ සමාලෝචිත වර්ෂයේ සත්‍ය වශයෙන් ලද ආදායම වන අතර එහි ඉදිරියට ලද ආදායම් හා ලැබිය යුතු ආදායම අන්තර්ගතව ඇති ආකාරය සනාථ කර ගැනීම ප්‍රායෝගික ගැටලුවක්ව පවතින අතර පාඨමාලා ගාස්තු අය කර ගැනීම සඳහා මහජන බැංකුව හා ලංකා බැංකුව සමඟ හඳුන්වා දී ඇති ක්‍රමවේදය අනුව ඉදිරියේ දී මෙම ගැටලුව වලක්වා ගැනීමට හැකිවනු ඇති බව. | ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 වර්ෂයේ සිට 2015 දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුව තිබූ අධිභාර මුදලින් රු.23,077,254 ක් කපා හැරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂයේදී අනුමැතිය ලැබී තිබුණද එය කපා හැරීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ගෙවන ලද රු.18,677,735 ක මුදල වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කිරීම නිසා උපචිත වියදම් රු.41,754,989 ක් වැඩියෙන්ද සමාලෝචිත වර්ෂයේ ලාභය රු.18,677,735 ක් අඩුවෙන් හා සමුච්චිත අරමුදල රු.23,077,254 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | එම මුදල් 2005 – 2015 දක්වා වර්ෂ 10 තුළ ගෙවා නිම කර ගැනීමට තිබූ නමුත් එම වටිනාකම හෙළිදරව් කර ඇත්තේ එම වසර 10 ඉක්මවීමෙන් පසුව වන බැවින් හා දැනටමත් කාලපරිච්ඡේදය ඉක්ම ගොස් දිගු කාලයක් වන බැවින් හා එම වර්ෂවලට අදාළ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සම්මත කර ඇති බැවින් එම වාර්තාවලට අදාළ පැහැදිලි කිරීම් ප්‍රායෝගික නොවන බැවින් සමාලෝචිත වර්ෂයේ මෙම හිඟව පැවති සේවක අර්ථ සාධක අරමුදල් ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. එසේ වී නමුත් අදාළ වියදම 2023 වර්ෂයේ ගිණුම්වල සමුච්චිත අරමුදලට ගැලපීම් කිරීමට කටයුතු කරනු ලබන බව. | කාල පරිච්ඡේදයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2008 වර්ෂයේ නේවාසිකාගාරයක සිදුකරන ලද රු.1,200,949 ක ප්‍රාග්ධන වියදම දිගින් දිගටම කෙරීගෙන යන වැඩ ලෙස දැක්වීම හේතුවෙන් නොනිමි වැඩ ගිණුමේ ශේෂය වැඩියෙන් සහ දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2008 වර්ෂයෙන් පසුව එළඹෙන වර්ෂවල පැවති අරමුදල් ඌනතාවය නිසා මෙම අලුත්වැඩියා කටයුතු 2019/2020 වර්ෂවල ප්‍රතිපාදන වෙන් කර දැනට සම්පූර්ණයෙන් නිම කර ඇති අතර ප්‍රාග්ධනිත කිරීම සඳහා අදාළ ගැලපීම් 2023 වර්ෂයේ ප්‍රතිස්ථාපිත ගිණුම් මගින් නිවැරදි කරනු ලබන බව. | කාර්යය නිම වූ පසු ප්‍රාග්ධන වියදම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මීපේ ගිනිගත් ගොඩනැගිල්ල පිළිසකර කිරීම වෙනුවෙන් රැඳවුම් මුදල වූ රු.637,390 ක් දෙවරක් බිල්පතට එකතුකර තිබීම හේතුවෙන් නොනිමි වැඩ ගිණුමේ සහ රැඳවුම් ගිණුමේ ශේෂය රු.637,390කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම්වල අදාළ නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරනු ලබන බව. | නිවැරදිව වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| නේවාසිකාගාර ආදායම | 15,739,042 | 16,786,946 | 1,047,904 | නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන ආදායම සැසඳිය යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ<br>(i) 394(ඇ)ඡේදය | සමාලෝචිත වර්ෂය අවසාන දිනට අවලංගු චෙක්පත්වල වටිනාකම රු.762,448ක් වූ අතර, ඊට අවශ්‍ය ගැලපීම් නිවැරදිව සිදුකර නොතිබිණි | 2023 වර්ෂයේ දී අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට පියවර ගනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 569,570 සහ 571 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ වසර 2 ඉක්මවූ විවිධ තැන්පතු රු.7,025,424 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති මුදල් චක්‍රලේඛ 01/2020 හා එම චක්‍රලේඛයෙහි ඡේද 9.1 මගින් සංශෝධිත 371(2)(ආ) වගන්තිය | තත්කාර්ය අතුරු අග්‍රිම රු.100,000 සීමාව ඉක්මවා ලබා දීමේදී රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ නිර්දේශය ඇතිව මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වුවද, ඊට පටහැනිව අවස්ථා 09 කදී එකතුව රු.2,448,335 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණි. | ආයතන සභාවේ අනුමැතිය වලංගු අනුමැතියක් නොවන බව විගණන විමසුමේ සඳහන් කර ඇති බැවින් මේ සඳහා මහා භාණ්ඩාගාරයෙන් අවසරය ලබා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලබන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන පනතේ 4(ක) සහ 28 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අනුමත කරගෙන නොතිබුණි. | ජාතික අධ්‍යාපන ආයතනයේ පැවති 469 වන ආයතන සභා රැස්වීමේ දී ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයට අනුමැතිය ලැබුණු අතර, එහි හැඳින්වීමේ පරිච්ඡේදයේ තව දුරටත් සංශෝධනයක් කිරීමට පවතින බැවින් එම සංශෝධනය අනුමත වීමෙන් පසු එම පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය භාණ්ඩාගාරයේ එකඟතාවය සඳහා යැවීමට නියමිත බව. | පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය අනුමත කරගෙන ඊට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.572,939,994 අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.72,631,933 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.645,571,927 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පාඨමාලා ගාස්තු ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ‘‘සැලසිනේ’’ රූපවාහිනී ආයතනය සමඟ 2021 දෙසැම්බර් 24 දින නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබූ අතර ගිවිසුම අනුව රූපවාහිනී වැඩසටහන් 05 ක් නිෂ්පාදනය කිරීමට රු.15,412,150 ක වියදමක් දරා තිබුණි. ඊට අදාළ ප්‍රචාරක වැඩසටහන් 2021 දෙසැම්බර් 29 දිනට ප්‍රථම අවසන් කළ යුතු වුවත්, සමාලෝචිත | ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් යටතේ පවතින මාධ්‍ය ඒකකය මගින් ඉදිරි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 45ක් නිර්මාණය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් පත් කරන ලද මාධ්‍ය උපදේශකගේ ද අධීක්ෂණය යටතේ කටයුතු කරන ලදී.<br><br>එම ප්‍රචාරණ කටයුතු ආසියානු සංවර්ධන බැංකුව විසින් තෝරා ගනු ලැබූ මාධ්‍ය උපදේශකවරුන් දෙදෙනෙකු විසින් සකස් කරනු ලබන සැලැස්මකට | ගිවිසුම්ගත කාර්යයන් නියමිත දිනවලදී නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය අවසන් වන විටත් අදාල වැඩසටහන් ප්‍රචාරණය කර නොතිබුණි. | අනුව කළයුතු විය.<br><br>අදාළ සැලැස්ම හා ප්‍රචාරණ ව්‍යාපෘතියේ ආරම්භක දිනය ගරු ජනාධිපතිතුමා විසින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සලකා බැලීම සඳහා පත් කර ඇති කැබිනට් අනු කමිටුවේ නිර්දේශ ලබා දීමෙන් පසුව තීරණය කෙරෙනු ඇති බව. | |
| (ආ) | ද්වී භාෂා (Bilingual) අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් රු.1,288,810 ක් වැයකර තිබුණද සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් අතරමග නවතා තිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශ පිරිවෙන් ඒකකය විසින් අවස්ථා කිහිපයක දී ලිඛිත විමසීම් සිදු කළ ද ඒ පිළිබඳ කිසිදු ප්‍රතිචාරයක් නොලැබීම හේතුවෙන් මෙම කාර්යය තාවකාලිකව නවතා තැබීමට සිදු වූ අතර එය වාර්ෂික සැලසුම සංශෝධනය මඟින් ද ආයතන සභාව දැනුවත් කර සැලසුමෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බව. | සැලසුම් සකස් කිරීමට හා වියදම් දැරීමට පෙර ප්‍රායෝගික තත්ත්වය ගැන සැලකිලිමත් විය යුතුය. |
| (ඇ) | වෘත්තීය සංවර්ධන පාඨමාලා යටතේ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් විෂයමාලා හා ශික්ෂණවේද අධ්‍යාපනපති පාඨමාලා (Master of Education in Curriculum pedagogy) සඳහා පරිච්ඡේද 200 ක් සමාලෝචිත වර්ෂයේදී පැවැත්වීමට සැලසුම් කර තිබුණද, ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ (Academic Affair Board) අනුමැතිය නොලැබීම හේතුවෙන් පාඨමාලාවන් ආරම්භ කර නොතිබුණි. | ආයතනය විසින් දැනට පවත්වාගෙන යනු ලබන Master of education පාඨමාලාවේ ඉදිරි ප්‍රති සංවිධාන කටයුතුවලදී වඩාත් ඵලදායී ලෙස කාර්ය සිදු කිරීමට සැලසුම් කර ඇති බැවින් තාවකාලිකව නවතා ඇති බව. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | (i)2003 දෙසැම්බර් 11 දින වන විට පැවති බඳවා ගැනීම් පරිපාටියට අනුව ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් හා අවශ්‍ය සේවා පළපුරුද්ද නොමැති ගුරු සේවයේ 2 – II තනතුරක වසර 13ක සේවා කාලයක් සහිත නිලධාරියෙකු ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී iv තනතුර සඳහා තෝරා ගෙන තිබූ අතර එම නිලධාරියාට විධිමත් පත්වීම් ලිපියක් ලබාදී නොතිබියදී පත්වීම් ස්ථිර කිරීමේ ලිපිය නිකුත් කිරීමට පෙර අධ්‍යක්ෂ(ඉංග්‍රීසි භාෂා) තනතුරට 2013 ජූලි 01 දින උසස් වීමක් ලබා දී තිබුණි. | නමුත් එම නිලධාරියා ඉංග්‍රීසි අංශයේ ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී ලෙස පත්වන අවස්ථාවේදී ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 - II තනතුරක සේවයේ නියුතුව සිටි ඇති අතර, එහි සම්පූර්ණ සේවා කාලය වසර 13කි. මොහු 2002.07.01 දින සිට කැළණිය විශ්ව විද්‍යාලයේ වාග් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර ඇත. මෙකී සුදුසුකම් අනුව ඉංග්‍රීසි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී තනතුරට 2004.08.02 දින සිට පත් කර ඇති බව. | බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 14.2 වගන්තිය ප්‍රකාරව විධිමත් පත්වීම් ලිපියක් නොලද තාවකාලික නිලධාරියෙකුට සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට හිමිකමක් නොතිබියදී ස්ථිර පත්වීම් ලිපියක් නිකුත් කර නොතිබුණු නිලධාරියෙකු වෙත අවස්ථා දෙකකදී වැටුප් සහිත විදේශ නිවාඩු අනුමත කර තිබුණි. | මෙම නිලධාරියා ගුරු සේවයේ තනතුරෙන් විධිමත් පරිදි නිදහස් කිරීමට කටයුතු කර ඇත්තේ 2017.08.15 දිනැති ලිපියක් මගිනි. ඒ අනුව මොහු වෙත වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දුන් කාල සීමාවලදී ජාතික අධ්‍යාපන ආයතනයේ විධිමත් පත්වීමක් නොදරා සිටි අයෙක් වුවත් විධිමත් පත්වීම 2004.08.02 දින සිට බලපැවැත්වෙන සේ ලබා දීම මගින් පසුකාලීනව විධිමත් වී ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) තාවකාලික පත්වීම් ලිපියක් ලබා දී වසර 13 කට පසුව පත්වීම ස්ථිර කිරීමට හේතුව පැහැදිලි කර පාලක සභා අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2004 අගෝස්තු 02 දින සිට වලංගු වන පරිදි IV ශ්‍රේණියේ ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී තනතුරේ නිලධාරියෙකු වෙත පත්වීම ස්ථිර කිරීමේ ලිපිය 2017 ඔක්තෝබර් 24 දින නිකුත් කර තිබුණි. | 2017.10.12 දිනැතිව එක් අවුරුදු පරිවාස කාලයකට යටත්ව 2004.08.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී තනතුර සඳහා විධිමත් පත්වීමේ ලිපියක් නිකුත් කර ඇත. මෙසේ වසර 13කට පසු විධිමත් පත්වීමේ ලිපියක් නිකුත් කිරීම සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ආයතන සභා අනුමැතියක් ලබා ගැනීම සිදු කර නොතිබූ අතර, එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් මෙම පත්වීම නිකුත් කර ඇති බව. | නියමිත පරිදි පත්වීම් ස්ථිර කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) 2013 ජනවාරි 18 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර තිබුණු බඳවා ගැනීමේ පරිපාටිය අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා) තනතුර සඳහා අධ්‍යක්ෂ තනතුරේ අවම වශයෙන් වසර 06ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. එහෙත් අදාළ නිලධාරියාගේ මුල් පත්වීම වූ ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී තනතුරේ විධිමත් පත්වීමේ ලිපිය හා එම තනතුර ස්ථිර කිරීම 2017 දී සිදුවී තිබීම නිසා 2013 ජූලි 01 දින සිදු කළ අධ්‍යක්ෂ(ඉංග්‍රීසි භාෂා) තනතුරට අදාල උසස්වීම බල රහිත වන බැවින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීමට ද එය අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය. | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර පිරිනමා ඇත්තේ 2021.07.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි ය. එවකට 2021.06.15 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මකව තිබූ අතර, එම පරිපාටිය ප්‍රකාරව අදාළ විෂය ක්ෂේත්‍රයේ අධ්‍යක්ෂ තනතුරක (HM1-1) වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු වේ.<br><br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී තනතුරේ විධිමත් පත්වීමේ ලිපිය හා එම තනතුරේ ස්ථිර කිරීම 2017 දී සිදු වී තිබීම නිසා 2013 දී සිදු කළ අධ්‍යක්ෂ තනතුරට අදාළ උසස්වීම් බලරහිත වන්නේ නම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව පිළිගවු ලබන බව. | බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) (i) | වර්තමානයේදී නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විද්‍යා හා තාක්ෂණ) තනතුරේ සේවය කරන නිලධාරියා 1999 ජුනි 01 දින ව්‍යාපෘති නිලධාරී තනතුරට පත්කිරීමේදී හා තනතුරේ ස්ථිර කිරීමේදී අදාල මූලික සුදුසුකම් පිළිබඳ සහතික සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1999.06.01 දින සහකාර ව්‍යාපෘති නිලධාරී තනතුරේ සිට ව්‍යාපෘති නිලධාරී තනතුර සඳහා පත් කිරීමේදී හා තනතුරේ ස්ථිර කිරීමේදී අදාළ මූලික සුදුසුකම් සනාථ කර නොතිබූ බව පිළිගන්නා බව. | සුදුසුකම් සනාථ කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2013 ජනවාරි 18 දිනැති අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව විෂයයට අදාළව පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කර නොතිබියදී, 2013 ජූලි 01 දින සිට අධ්‍යක්ෂ (ගණිත) තනතුරේ පත්වීමක් ලබා දී තිබුණි. | 2013.07.01 දින සිට අධ්‍යක්ෂ (ගණිත) ලෙස පත් කර තිබේ. 2013.01.18 දිනැති අනුමත බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව අදාළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කළ යුතු වේ. අදාල නිලධාරියා විසින් සිය පශ්චාත් උපාධිය Sussex විශ්ව විද්‍යාලයෙන් සම්පූර්ණ කර ඇති අතර, උපාධි සහතිකයේ සඳහන් වනුයේ Degree of Master of Arts International Education යනුවෙන් බව. | බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධ්‍යක්ෂ (මුදල්) තනතුරට 2016 දෙසැම්බර් 01 දින සිට පත් කර තිබූ නිළධාරියෙකුට බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව සපුරාලිය යුතු පශ්චාත් සේවා පළපුරුද්ද නොතිබුණි. | තනතුර සඳහා එවන ලද අයදුම්පත්‍රයේ විධායක අදියර 1 සුදුසුකම සම්පූර්ණ කරන ලද වසර ඇතුළත් කර නොමැත. අනතුරුව ඉදිරිපත් කරන ලද සහතික පරීක්ෂාවේදී පැහැදිලිවනුයේ මෙම විධායක අදියර 1 2012 දෙසැම්බර් මාසයේදී සම්පූර්ණ කර ඇති බවයි. ඒ අනුව ඌන සේවා පළපුරුද්දක් සහිතව බඳවාගෙන ඇති බව පිළිගන්නා බව. | බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1992 මැයි 2 දින සිට විගණන සහකාර තනතුරට පත් කරන ලද නිලධාරියෙකු 2012.08.03 දින සිට වැඩ බලන අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරට පත් කර ඇත. එම නිලධාරියා ප්‍රතිව්‍යුහගතකරණ අනුමත කිරීමට ප්‍රථම විගණන නිලධාරී තනතුරට පත් කර තිබුණි. | 2012.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරට පත් කර තිබේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2011.12.22 දින ජාතික අධ්‍යාපන ආයතනය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර ඇත. නමුත් බඳවාගැනීමේ පරිපාටිය අනුමත කර ඇත්තේ 2013.01.18 දිනැති ලිපිය මඟිනි. ඒ අනුව අදාළ නිලධාරියා වැඩ බලන අභ්‍යන්තර විගණන නිලධාරි තනතුරට පත් කරන විට අනුමත තනතුරක් පැවත ඇති අතර, ඒ සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය පමණක් අනුමත වී නොතිබූ බව. | නිලධාරීන් බඳවා ගැනීමේ දී ඒ සම්බන්ධයෙන් පවතින ක්‍රමවේද අනුගමනය කළ යුතු වේ. |